
# රෙබෙකා'ගෙන් 'ජේන් අයර්'ට




**ආචාර්ය විද්‍යානි මනතුංග**

## ප්‍රමිතා රෝහිණී වනිගරත්න ගේ නවතම පරිවර්තන කෘතිය එළිදැක්වෙයි

ප්‍රමිතා රෝහාණී වනිගරත්න මුලින් ම ලේඛිකාවක ලෙස අප හමුවට එන්නේ 2007 වසරේ දී ය. ඒ ඇගේ කවි හා කෙටි කතා එකතුවන් වන 'හිරට මුවාවෙන්' මුද්‍රණය වීමත් සමඟ ය. ගෙවුණු අට අවුරුදු කාලය තුල ඇය පොත් පහක් පළ කර ඇත. ඒ පොත් අතරට නව කතා මෙන්ම පරිවර්තන කෘති ද ඇතුළත් වන්නේ ලේඛිකාවක් ලෙස ඇය තුල වන දක්ෂතාවත්, උද්යෝගයත්, කැපකිරීමත් පෙන්නුම් කරමිනි.

නොබෝ දා ඇගේ දෙවන පරිවර්තන කෘතිය වූ 'ජේන් අයර්' එළි දක්වන ලදි. පොතක් මුද්‍රණය කිරීම විශාල අභියෝගයක් ව පවතින යුගයක ඇගේ පරිවර්තන කෘති දෙකම සාංශිප්ත නොකර පූර්ණ අනුවාද ලෙසට ප්‍රකාශයට පත් වීම අප අගය කල යුත්තකි.

ඇගේ මුල්ම පරිවර්තන කෘතිය වන 'රෙබෙකා' කියවා ඒ පිළිබඳ ව අතිශ්‍යය ප්‍රසාදයට පත්වනවා මට මතක ය. 'ජේන් අයර්' තුලින් ද ඇය දක්වා ඇත්තේ මුල් පරිවර්තන කෘතියට නොදෙවෙනි දක්ෂතාවකි. තමාගේ නොවන කෘතියක් මුල් කෘතියේ එන කතා සැකිල්ලත්, නිර්මාණයේ ආකර්ශණයත් නැසී යා නො දී වෙනත් භාෂාවකින් පාඨකයා අතට පත් කිරීම සුළුපටු කරුණක් නොවේ යැයි සිතමි. එක ම මුල් කෘතියක පරිවර්තන කිහිපක් එක හා සමාන ව අප සිත නොගනී. එසේ සිත් බැඳ ගන්නා අයුරින් පරිවර්තන කාර්යයේ නිරත වීම ලේඛකයා හෝ ලේඛිකාව සතු සුවිශේෂ දක්ෂතාවක් වන්නේ එබැවිනි.

රෝහිණීගේ පරිවර්තන කෘති වල එන අපූර්වත්ව ය ඇය සතු මනාව බස් වහර ගලපා ගැනීමේ හැකියාව යි. ඇගේ බස් වහර පාඨකයාගේ මනස තුල කතාවේ ස්වභාවික ගලා යෑමට අවැසි හැඩතල නිර්මාණය කරනවා විනා එයට අස්වාභාවිකත්වයකක් හෝ බාධාවක් හෝ ඇති නොකර යි. එය කතා වේ මුල් රචකයාගෙන් ඇය ලබාගන්නක් නොවේ. සුපුරුදු සිංහල භාෂාවේ ම ඇති සුපුරුදු සහ නුපුරුදු තැන් ඇය විසින් මනාව ගලපාගැනීමෙන් ගොඩනගා ගත් විචිත්‍රත්වයකි.

සිංහල පාඨකයන්ට උසස් විශ්ව සාහිත්‍ය කෘති සංශිප්ත නො වූ පූර්ණ අනුවාද ලෙසට පරිශීලනය කිරීමට අවස්ථාව සපයමින් සිය කාලය, ශ්‍රමය, සහ ධනය නොමසුරුව වැයකරමින් ඇය කරන්නේ අගය කල යුතු සත්කාරියකි. ඇගේ ඉදිරි ලේඛණ කටයුතු වල සාර්ථකත්වයත් පරිවර්තන මෙන් ම ස්වනිර්මාණ ද තවතවත් තිළිණකර දීමට අවශ්‍ය ශක්තිය සහ ධෛර්යය ඇයට ලැබේවා යි සිංහල පාඨකයන් වෙනුවෙන් මම ප්‍රාර්ථනා කරමි.

**LAND FOR SALE**

**BATTARAMULLA**

SUBUTHIPURA - ROHANA MAWATHA

**9 Perches**

Contact

**Liyanage 0468 685 464**

## නිව් සවුත් වේල්ස්හි චෙරීබෘක් සිංහ සමාජයෙන් තවත් සමාජ සත්කාර්යයක්




**දීපිකා ශ්‍රියාණී සුන්ද්‍රා වඩු**

**අනුරාධපුරයෙහි, වකුගඩු ව්‍යාධිය නිසා පීඩා විඳින ප්‍රදේශ දෙකක ජනතාවට, පිරිසිඳු පානීය ජලය ලබා ගැනීමට ජල පවිත්‍රාගාර දෙකක් ස්ථාපනය කිරීම**

වකුගඩු රෝගය, මේ වන විට ශ්‍රී ලංකාවේ ප්‍රධාන සෞඛ්‍යය ගැටළුවක් බවට පත් වී තිබේ. ප්‍රභවය කුමක්දැයි මෙතෙක් සොයා ගත නොහැකි වූ, මෙකී වකුගඩු රෝගයෙන් බෙහෙවින්ම පීඩාවට පත්ව සිටින්නේ, ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ජන කොටස්ය. මෙම ව්‍යාධිය, මුල දී උතුරු මැද හා ඌව පලාත් වලට පමණක් සීමා වී පැවති නමුත්, දැන් වයඹ, නැගෙනහිර, දකුණු හා මධ්‍යම පලාත් වලටත්, උතුරු පලාතේ කොටසකටත් ව්‍යාප්ත වී ඇත.

දරිද්‍රතාවයෙන් පෙළෙන මෙම ප්‍රදේශවල ජීවත් වන ජනතාවගෙන් බහුතරය වී සහ හේන් ගොවියෝ ය. බහුලව රෝගයට ගොදුරුවන්නෝ, පිරිමි ගොවියෝ සහ කෘෂිකාර්මික කම්කරුවෝ වෙති. එසේ වුවත්, රෝගයට ගොදුරු වන කාන්තාවන්ගේ සහ ළමුන්ගේ සංඛ්‍යාව ඉහළ නැගෙමින් තිබෙන බව වාර්තා වෙයි. එමෙන්ම මාසයකට මෙම වකුගඩු රෝගීන් 1,100 කට වැඩි සංඛ්‍යාවක් රෝහල් ගත වන බවත්, දිනකට 13 දෙනකු මියයන බවත් වාර්තා වී ඇත. මෙය සුනාමියට ද වඩා භයානක තත්ත්වයකි. කෙසේ වෙතත් මෙම රෝගයෙන් පිඩා විඳින බොහෝ පිරිසකට, රෝග නිවාරණයට හා රෝගය මැඩ පැවැත්වීමට අවැසි සෞඛ්‍යය හා වෛද්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා ද සීමිතව තිබීම ඉතාම අවාසනාවන්ත තත්වයකි. එහෙයින් මෙම වකුගඩු රෝගය පවතින ප්‍රදේශවලට බීමට සුදුසු පිරිසිදු පානීය ජලය සැපයීම, මෙම ව්‍යාධිය පාලනය කිරීමේ අතිශයින් වැදගත් මැදිහත්වීමක් ලෙස පෘථුල ලෙස පිළිගැණේ.

මේ අනුව, බටහිර පෙනන්ට්හිල්ස්හි, චෙරිබෘක් සිංහ සමාජය, අන්තර්ජාතික මානුෂීය ව්‍යාපෘතියක් ලෙසින්, අනුරාධපුර ප්‍රදේශයේ වකුගඩු රෝගය නිසා පීඩා විඳින ප්‍රදේශ දෙකක 8000ක් තරම් වූ පිරිසකට පානීය ජලය සැපයිය හැකි, පවිත්‍රාගාර දෙකක් ලබා දීමට මෑතදී කටයුතු කළේය. තම සහෝදර ශ්‍රී ලංකාවේ වත්තල සිංහ සමාජයෙහි සත්කාරය හා ශ්‍රම දායකත්වය ඇතිව, මෙම පවිත්‍රාගාර දෙක ස්ථාපනය කළ අතර, අනුරාධපුර දිස්ත්‍රික්කයේ හුරුළුකුම්බුක්වැව හා ගැටලාව ගම්මානයන්හි ලියාපදිංචි ප්‍රජා සංවිධාන දෙකකට 2015 දෙසැම්බර් 21 වන දින එම ජල පවිත්‍රාගාර දෙක පවරනු ලැබීය.

ජල පවිත්‍රාගාර දෙක මිලදී ගැනීමට හා ස්ථාපනය කිරීමට දල වශයෙන් රුපියල් මිලියන තුනක් පමණ වැය වින. ඉන් රුපියල් මිලියන 1.5ක් පමණ බටහිර පෙනන්ට්හිල්ස් චෙරිබෘක් සිංහ සමාජය ලබාදුන් අතර, එකී සිංහ සමාජයේ ඉල්ලීම මත, ජාත්‍යයන්තර සිංහ සමාජ පදනම මඟින් ඉතිරි රුපියල් මිලියන 1.5 ලබා දෙන ලදී. ශ්‍රී ලංකා ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව මඟින් රුපියල් මිලියනයක ප්‍රදානයකින් ගොඩනැගිලි, ටැංකි සහ නල පද්ධති යනාදී යටිතල පහසුකම් සපයන ලදී.

හුරුළුකුම්බුක්වැව හා ගැටලාව ගම්මානයන්හි ලියාපදිංචි ප්‍රජා සංවිධාන දෙක මගින් ඉඩම් ලබා දෙනු ලැබූ අතර, ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමෙන්තුවේ අධීක්ෂණය යටතේ, එකී ප්‍රජා සංවිධාන දෙක මගින් ජල පවිත්‍රාගාර ක්‍රියාත්මක කටයුතු හා නඩත්තු කටයුතු කරනු ඇත.

සැබවින්ම මෙකී වකුගඩු රෝගය පැතිරී ඇති ගම්මාන වලට, පිරිසිඳු පානීය ජලය ලබා දීමට මෙවන් පවිත්‍රාගාර දහස් ගණනින් අවශ්‍යය වේ. තවද ඉදිරියට ගෙන යන ප්‍රජා සත්කාරයක් ලෙස, වත්තල සිංහ සමාජය මඟින්, බටහිර පෙනන්ට්හිල්ස් චෙරීබෘක් සිංහ සමාජයේ මූල්‍යය අනුග්‍රහය ඇතිව, බහු සේවා වෛද්‍යය සායන දෙකක් ද ගම්මාන දෙකේ සංවිධානය කරනු ලැබීය.

දිස්ත්‍රික් සිංහාධිපති සිංහ ක්‍රිස්ටි නානායක්කාර (දිස්ත්‍රික් 306 බී 1, ශ්‍රී ලංකා), ව්‍යාපෘති සභාපති සිංහ මොහාන් නානායක්කාර (බටහිර පෙනන්ට්හිල්ස් චෙරීබෘක් සිංහ සමාජය), සිංහ වෛද්‍ය මහේෂි නානායක්කාර (බටහිර පෙනන්ට්හිල්ස් චෙරීබෘක් සිංහ සමාජය), හිටපු සිංහාධිපති සිංහ ලක්ෂමන් විජේසිංහ, හිටපු බහු සිංහ සමාජ සභාපති සිංහ චිත්‍රාල් අමරතුංග, සිංහ වෛද්‍ය සේබා ජයමහ (වත්තල සිංහ සමාජය) සිංහ වෛද්‍ය අනෝමා විජේසිංහ (වත්තල සිංහ සමාජය) සිංහ සුනිල් ජයවීර (සභාපති වත්තල සිංහ සමාජය) සහ එම අවස්ථාවට සහභාගි වූ පිරිසෙන් කොටසක් ගැටලාව ජල පවිත්‍රාගාරය ඉදිරිපස දී ගත් ඡායාරූපය ඉහතින් දැක්වේ.



සන්නස

බලන්නට ඇති පත්තර අතර
කියවන්නට ඇති පත්තරයක්